**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය, මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත, ණයහිමියන් රු.64,526 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුයි. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉටු කරන ලද කර්මාන්ත 07 ක් සඳහා රු.854,980 ක මුදල් 2023 වර්ෂය තුළ ප්‍රතිපූර්ණය වී ඇතත්, එම වටිනාකම කර්මාන්ත ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී රු.778,904 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සභාව සතු ඉඩම් 05 ක වටිනාකම රු.590,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුයි. |
| (ඉ) | වටිනාකම රු.153,377 ක් වූ විවිධ ණය හිමියන් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාව සතු ඉඩම් කැබලි 30 ක වටිනාකම රු.16,206,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | 2023 වර්ෂය තුළ වැඩ අවසන් කර තිබූ කර්මාන්ත 10 ක වටිනාකම රු.8,673,505 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | 2023 වර්ෂය තුළ වැඩ අවසන් කර තිබූ කර්මාන්ත 05 ක වටිනාකම රු.778,324 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (එ) | 2023 වර්ෂය තුළ මිලදීගෙන ඇති රු.1,922,100 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 04 ක් ස්ථාවර වත්කම් ලෙස හා ජංගම වත්කම්වල ගබඩා අයිතමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් හා ගොඩනැගිලි 10 ක් සමාලෝචිත වර්ෂය වන විටත් තක්සේරු නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුමගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 12,356,376 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.53,500ක වෙනසක් විය. | වෙනස්කම්වලට හේතු හඳුනාගෙන ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,165,071 ක් වූ ගිණුම් විෂය 08 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පෙර වර්ෂවල සිට පැවත එන ශේෂයන්ද මේ තුළ පවතින අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 571(2) | වසර 02 ක කාලය ඉක්ම වූ වටිනාකම රු.1,043,710ක මිශ්‍ර තැන්පත්, ගිවිසුම් තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, පදික කඩ තැන්පත් හා ජල තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 02 ක ඉක්මවූ මිශ්‍ර තැන්පත්, ගිවිසුම් ඇප තැන්පත් හා ටෙන්ඩර් ඇප තැන්පත් 2024 වර්ෂය තුළදී මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි. | සභාව සතු වාහන 31 න් 25 ක අදාළ ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය සළකුණු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව. | රාජ්‍ය ලාංඡනය සමඟ ආයතනයේ නම සළකුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 6 වගන්තියේ (ආ) හා (ඇ) | 2023 වර්ෂයේදී අලුත් කළ යුතු පරිසර ආරක්ෂණ බලපත්‍ර 16ක් අලුත් කර නොතිබීමෙන් සභාවට පැවරී ඇති පරිසරය නියාමනය කිරීමේ වගකීම පැහැර හැර තිබුණි. | බලපත්‍ර ලබාගන්නා ලෙස දැනුවත් කිරීම කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,238,181 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,796,101 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගතආදායම් රැස්කළ ආදායම් හා ,බිල්කළ ආදායම් ,හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | 2023 වර්ෂය බිල් කළ ආදායම | 2023 වර්ෂය රැස්කළ ආදායම | 2023 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | 2022 වර්ෂය බිල් කළ ආදායම | 2022 වර්ෂය රැස්කළ ආදායම | 2022 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ |
| වරිපනම් හා බදු | 4,040 | 40,064 | 5,185 | 4,960 | 4,024 | 4,024 | 5,114 | 6,376 |
| කුලී | 8,336 | 19,639 | 12,366 | 2,909 | 11,300 | 11,783 | 12,856 | 3,396 |
| බලපත්‍ර ගාස්තු | 1,525 | 1,525 | 1,525 | - | 2,200 | 2,179 | 2,179 | - |
| වෙනත් ආදායම් | 102,904 | 88,170 | 89,365 | 89,259 | 11,315 | 9,550 | 67,046 | 28,652 |
| එකතුව | 116,805 | 149,396 | 108,441 | 97,128 | 28,839 | 27,536 | 87,195 | 38,424 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 15 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට පවතින කඩ කුලී රු.106,350 ක් අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අදාල හිඟය අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරුකර, ඒඅනුව වරිපනම් ගාස්තු අයකළ යුතු වුවත් ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපල අවසන් වරට තක්සේරු කර තිබුණේ 2012 වර්ෂයේදීය. | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අදාල වාර්තා ලැබුණු පසු අයකිරීම් කටයුතු සිදු කරන බව. | නව තක්සේරුවක් ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් 18 ක බදු දීම මඟින් අයකර ගත යුතු බදු කුලී හිඟය රු.2,131,450 ක් වී තිබුණු අතර එම කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර අය කර ගත නොහැකි හිඟ මුදල් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් පසුව කපා හැරීමට හා අය කරගැනීමට කටයුතු සිදු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඈ) | විගණිත දිනය වන 2023 දෙසැම්බර් 31 දින වන විට හිරිපිටිය එළහරක් මස් කඩයේ හිඟ මුදල රු.155,000 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල හිඟ මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කලමනාකරණය වෙනුවෙන් කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම හා කසල එකතු කිරීම වෙනුවෙන් රු. 10,318,653 ක ප්‍රාග්ධන වියදමක් හා රු. 22,712,931 ක පුනරාවර්ථන වියදමක් දරා තිබුණද එම ව්‍යාපෘතිය 2023 සදසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට සහාව අපොහොසත් වී තිබුණි. ඒ අනුව රැස්කරනු ලබන කසලවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය නොකරන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ වල දැමීම සිදු කරන අතර රැස් කරනු ලබන ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, පොලිතීන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ තාවකාලිකව ඉදිකර ඇති කසල අංගනයේ ගබඩා කිරීම සිදුකර තිබුණි. | කසල කළමනාකරණය කිරීමේ අරමුණින් ඉදි කරන ලද කොම්පෝස්ට් අංගනයේ කටයුතු මේ වන විට අවසන් කර කොම්පෝස්ට් නිෂ්පාදනය ඉදිරියේ දී ආරම්භ කරන බවත්. නොදිරන කසල බේල් යන්ත්‍රය මඟින් විකිණීමේ කටයුතු සඳහා සකස් කරමින් පවතින බව. | කසල කළමනාකරණය කර ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉබ්බාගමුව නගරයේ දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ ඉදිකර වැඩ අවසන් කර ඇති සතිපොළ භූමිය 2023 දෙසැම්බර් 31 දින වන විටත් විවෘත කර පොළ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර මෙම ගොඩනැගිල්ල සඳහා 2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා රු.2,385,176 ක් වියදම් දරා ජල සැපයුම, විදුලි සැපයුම, ප්‍රවේශ මාර්ගය සැකසීම ආදිය සඳහා වියදම් දරා තිබුණි. | වෙළෙන්දන්ගෙන් පැවති දැඩි විරෝධය හමුවේ මෙය අසාර්ථක වූ අතර දැනට විවිධ අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මුදල් ගෙවා ලබාදෙන බවත් විකල්ප පොළක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරමින් සිටින බවත්. | සති පොල විවෘත කර පොල කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොකරැල්ල උප කාර්යාලයට අයත් මැල්සිරිපුර පිහිටි කඩ කාමර අංක 04 හි, ගිවිසුමේ කාලය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණද බදුකරු විගණිත දිනය වන විටත් කඩය පවත්වාගෙන යන බැවින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගතවීම් නිසි පරිදි සිදු කර නොතිබුණු බැවින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් වලින් පසුව ඉදිරි කටයුතු සිදුකරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමීක්ෂණය තුළින් හඳුනාගන්නා ලද සියලු වෙළඳ ව්‍යාපාර, කර්මාන්ත හා වෘත්තීන් ලේඛනගත කර නොතිබූ අතර, බලපත්‍ර ගාස්තු සඳහා මුදල් ගෙවන එවැනි ව්‍යාපාර, කර්මාන්ත හා වෘත්තීන් පමණක් ලේඛනයේ ඇතුළත් කර තිබුණි. | ගිවිසුම්ගතවීම් නිසි පරිදි සිදු කර නොතිබුණු අතර නව තක්සේරුවට අනුව කඩිනමින් ගිවිසුම් ගත විමටඅවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හඳුනා ගන්නා ලද සියලු ව්‍යාපාර ලේඛන ගත කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි 19 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් හා ගොඩනැගිලි සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආයතනවල නමට ලියාපදිංචි වී ඇති වාහන 04 ක, එනම් ඩබල් කැබ් රථයක, ගලි බවුසරයක, ට්‍රැක්ටර් ට්‍රේලරයක හා කාර් රථයක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මෙම සභාව වෙත පවරා ගැනීමට මේ වනවිට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව භාවිතා කරන වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව (කර්මාන්ත අංශයේ ආංශික සැලැස්ම) සභාව විසින් ව්‍යාපෘති 63 ක් ඉටු කළ යුතුව තිබුණත් ඉන් ව්‍යාපෘති 08 ක් පමණක් ඉටු කර තිබුණි. ඉටු නොකළ ව්‍යාපෘති හා ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.14,195,519ක ප්‍රතිපාදන සලසා තිබුණි. | සැලැස්ම සකස් කිරීමේ දී යෝජනා වූ ක්‍රියාකාරකම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ නමුත්, රට මුහුණ දෙමින් සිටි ආර්ථික අර්බුදය හමුවේ, පැනවූ සීමාවන් හේතුවෙන් ක්‍රියාකාරකම් 8ක පමණක් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ රු.18,884,576 ක් වූ ව්‍යාපෘති 17ක් ඉටුකර තිබූ අතර ඒ සඳහා වාර්ෂික අයවැය මඟින්ද ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත නොවූ නමුත් අත්‍යාවශ්‍ය සංවර්ධන වැඩසටහන් වූ නිසා මෙම ව්‍යාපෘති ඉටු කරන ලද බව. | ක්‍රියාකාරී සැලැස්මට අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ඇතුළත් කළ යුතු අත එලදායී කළමනාකරණ මෙවල මක් වශයෙන් යොදා ගත යුතුය. |

### 4.2 තිරසාර සංවධර්න ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණ සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබූ අතර තිරසර සංවර්ධන අරමුණු 07 ක් ළඟාකර ගැනීම සඳහා ව්‍යාපෘති 08 ක් ඉටුකිරීම වෙනුවෙන් රු.14,195,519ක වියදමක් දරා තිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී විවිධ අභියෝගයන් හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සීමා වී ඇති බව. | හැකි තාක් දුරට තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |